යාපනය මහ නගර සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 09 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින නගරාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට යාපනය මහ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් දේපළ 71 ක වටිනාකම තක්සේරු කොට ගිණුම්වලට ගෙන නොතිබීම හේතු කොට ගෙන සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල දේපළ වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පළාත් පාලන සේවා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්‍ෂ ජනරාල් විසින් ඉල්ලා තිබූ රු. 115,168,996 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) නිකුත් කළ උපලේඛන පරිදි, හිඟ වරිපනම් ගණනය කර නොතිබූ අතර, එය දේපළ තක්සේරුවෙන් සියයට 6 ක් ලෙස සාවද්‍ය ලෙස ගණනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය අවසානයේ සමුච්චිත වරිපනම් හිඟ එකතුව රුපියල් මිලියන 78.74 කින් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.3 නොසැසඳූ ගිණුම්
-----------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ආදායම් අයකර ගැනීම හා හිඟ ආදායම් සහ ආදායම් ලේඛනවල දැක්වුණු අනුරූපි ශේෂ අතර රු.19,757 සිට රු.236,177 ක පරාසයක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූලා ප්‍රකාශනවල ඇතුළත් හිඟ වරිපනම් හා බදු අතර රුපියල් මිලියන 11 ක වෙනසක් නිරීක්‍ෂණය විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

--------------------------------------

විගණනයට තොරතුරු ඉදිරිපත් නොකිරීම

---------------------------------------------

ලාභීන් පිළිබඳ තොරතුරු, ලබාදුන් හේතු සහ ඒවා නිකුත් කළ දිනයන් පිළිබඳ විස්තර ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.7,112,085 ක් වූ අත්තිකාරම් ගෙවීම් විගණනයේදී සතුටුදායක අන්දමින් සන්නිරීක්‍ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම

--------------------

නීති,රීති රෙගුලාසි සහ කළමනාකාරීත්ව තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1987 මහ නගර සභා ආඥා පනත | | |
| | I 252 පරිච්ඡේදයේ 42(1) වගන්තිය | - | සභාවට අයත් තාවකාලික කඩ කාමර දොළහක් ස්ථිර කඩ කාමරවලට පරිවර්ථනය කර තිබූ අතර, අනවසර ගොඩනැගිලි සම්බන්ධයෙන් සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| | II 252 පරිච්ඡේදයේ 42(අ) වගන්තිය | | සභාවේ අනුමැතියක් නොගෙන ඉදිකරන ලද විදුලි සන්දේශ කුළුණු ගොඩනැගිලි නවයක් පිළිබඳව ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |
| | III 252 පරිච්ඡේදයේ 230 වගන්තිය | | පසුගිය වසර 05 ක් තුළ සභාව විසින් දේපළ තක්සේරු කිරීම් සිදුකර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| | I මුදල් රෙගුලාසි 371 | 549,000 | සභාවේ සේවකයන් 50 දෙනෙකුට සාම්ප්‍රදායික කර්මාන්ත සහ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේදී නිකුත් කරන ලද පාපැදි අත්තිකාරම් මේ දක්වාම නිරවුල් කර නොතිබුණි. |
| | II මුදල් රෙගුලාසි 571 | 2,678,118 | මිශ්‍ර තැන්පතු විසිහතරක් වසර දෙකකට අධික කාලයක් තිස්සේ අවශ්‍ය කටයුතු කිරීමෙන් තොරව තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | III මුදල් රෙගුලාසි 849(2) | 13,993 | මහනගර සභාවේ සභිකයන් තිදෙනෙකුට සභා අරමුදලෙන් ජාත්‍යන්තර ඇමතුම් ගාස්තු ගෙවා තිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණඅමාත්‍යාංශ චක්‍රලේඛය | - | පසුගිය වසර පුරාම සභාවේ වාහන 33 ක ඉන්ධන පරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි. |
| (ඈ) | 2017 මාර්තු 07 දිනැති අංක PF/01/2017 දරන උතුරු පළාත් මුදල් චක්‍රලේඛය | | මුදල් භාරගැනීම සහ බඩු ගබඩා හෝ ඒවායේ සුරක්ෂිත භාරකාරීත්වය පිළිබඳ පරිපාලනමය වශයෙන් හෝ බලතල පැවරීම් යටතේ වගකීම් පැවරුණු නිලධාරීන් 36 දෙනෙකුගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. |
| (ඉ) | උතුරු පළාත් මූල්‍ය රීති රීති අංක 69 | | අනතුරකට පත් සභාවට අයත් පික්අප් රථය පිළිබඳ පසුගිය වසර තුනක් තිස්සේ අර්ථවත් ක්‍රියාපිළිවෙතක් ගැනීමට සභාව අසමත්ව තිබුණි. |

1.3.5.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

----------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී සභාව විසින් භාවිතා කළ වාහන 21 ක් සඳහා වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තු ගණනය කොට ගෙවීම්කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.231,451,523 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.143,963,688 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

-----------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

--------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**2017** **2016**

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 74,677,000 | 50,796,815 | 77,086,379 | 78,740,943 | 60,800,000 | 51,730,391 | 74,086,322 | 77,968,600 |
| (ii) කුලී | 103,932,000 | | 101,762,393 | | 90,292,000 | | 78,669,607 | |
| (iii)බලපත්‍ර ගාස්තු | 68,489,000 | | 65,046,106 | | 69,962,000 | | 70,020,699 | |
| (iv)වෙනත් ආදායම් | 102,902,000 | | 170,746,912 | 260,474,339 | 80,737,000 | | 123,390,323 | 370,972,912 |
| එකතුව | 350,000,000 | 50,796,815 | 414,641,790 | 339,215,282 | 301,791,000 | 51,730,391 | 346,166,951 | 448,941,512 |

2.2.2 වරිපනම් සහ බදු

--------------------

වරිපනම්

---------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

i. පසුගිය වසර 03 සඳහා වරිපනම් බදු අයකර ගැනීම සඳහා දේපළ අයිතිකරුවන්ට නිකුත් කළ උපලේඛන 57360 " K " ආකෘතියේ ලියා නොතිබූ බැව් නිරීක්ෂණය විය.නමුත් එකකට රු. 3.50 බැගින් එකතුව රු.200,760 ක් දෙවර්ගයක ගාස්තු සම්බන්ධයෙන් නිලධාරීන්ට ගෙවා තිබුණි. කෙසේවුවද, එවැනි උපලේඛන නිකුත් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සභාව විසින් අර්ථවත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබූ අතර, ඊට හේතු විගණනයට ලබා නොදුණි.

ii. පසුගිය වර්ෂ 03 තුළ නිකුත් කළ උපලේඛනවල සියයට 15 සිට සියයට 40 දක්වා වූ පරාසයක අඩුපාඩු නිරීක්ෂණය විය. සභාව විසින් හඳුනාගත් දේපළ සංඛ්‍යාව වෙනුවෙන් වරිපනම් බදු තහවුරු කිරීම් ඉදිරිපත් නොකිරීම උපලේඛනවල ලියා තිබූ දේපළ සංඛ්‍යාව සහ නිකුත්කළ උපලේඛනවල වූ දේපළ සංඛ්‍යාව අතර වූ වෙනස්කම් හේතුකොටගෙන උපලේඛන නිකුත් කිරීමේදී අඩුපාඩු සතුටුදායක අන්දමින් පරීක්ෂා කර නොතිබූ බැව් පෙනී ගියේය.

iii. එකතුව රු.78,740,943 ක්වූ හිඟ තක්සේරු බදු අයකර ගැනීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.3 කුලී මුදල්

--------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) කඩකුලී

----------

නව වෙළඳ සාප්පු සංකීරණයේ පිහිටි කඩකාමර 04 ක් සඳහා වූ එකතුව රු.660,000 ක්වූ හිඟ කුලී අයකර ගැනීම සඳහා සභාව විසින් පසුගිය වසර පහ පුරාම අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වෙළඳ අයිතිය බදුදීම
----------------------
එකතුව රු.1,232,634 ක්වූ හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා සභාව විසින් පසුගිය වසර පහ පුරාම අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 බලපත්‍ර ගාස්තු
---------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) වෙළඳ බලපත්‍ර
----------------
එකතුව රු. 240,534 ක්වූ හිඟ වෙළඳ පොළ කඩ බලපත්‍ර ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් පසුගිය වසර පහ පුරාම අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වෘත්තීය බලපත්‍ර ගාස්තු
-------------------------
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2017 ජනවාරි 19 දිනැති අංක 2055 දරන ගැසට් නිවේදනය මඟින් 1978 අංක 19 දරන මහ නගර සභා ආඥා පනතේ 252 පරිච්ඡේදයේ 147 වගන්තියේ 247(ඇ) උපවගන්තිය අනුව, රු.2,000 සිට රු. 5,000 ක පරාසයක වෘත්තීය බද්දක් අයකර ගත යුතු බව සඳහන්ව තිබුණි. එනමුත් එකතුව රු.777,663 ක්වූ මුදලක් අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

2.2.5 මුද්දර ගාස්තු
----------------
2017 දෙසැම්බර් 31 දිනට රු.96,918,652 ක්වූ මුද්දර ගාස්තු දිගින් දිගටම ලැබිය යුතුව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-------------------------------------
පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(I) සභාවේ භෞතික සැලසුම් අංශයේ මහජන කළමනාකරණ සහායක විසින් 2016 වර්ෂයතුළදී කුවිතාන්සි නිකුත් කිරීම මඟින් රැස්කළ ආදායම්වලින් එකතුව රු.2,614,429 ක්වූ මුදල් ඔහු විසින් වංචනිකව ලබාගෙන තිබුණි. එනමුත් එම මුදල සාර්ථක අන්දමින් අයකර ගැනීමේ කටයුතු පසුගිය වසරක කාලය පුරාම පමාකර තිබූ බැව් නිරීක්ෂණය විය.

(II) රු.3,710 ක්වූ මුදල් ඌනතාවයක් සහ රු.21,222 ක්වූ විදුලි අංශයට සම්බන්ධ ආපසු ලැබුණු චෙක්පත් පිළිබඳව පසුගිය වසර පහ පුරාම අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සංචිත උපයෝගිකර ගැනීමට අසමත්වීම
-------------------------------------------
විවිධ අරමුණු සඳහා වාර්ෂිකව සභාව විසින් ආදායමින් සංචිත ඇතිකර තිබුණි. එනමුත්, එම සංචිත අපේක්ෂිත අරමුණු සඳහා උපයෝගී කර නොගෙන ඉතිරිව පැවතිණි. විස්තර පහත දැක්වේ.

| සංචිතය | | 2017 දෙසැම්බර් 31 දින ශේෂය | වාර්ෂික සංචිත වෙන්කිරීම | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I | සංවර්ධන සංචිතය | 20,875,028 | 26,102 | 1,264,681 | 13,035,789 | | |
| II | මහජන අරමුදල් සංචිතය | 21,834,279 | 14,052,807 | 2,355,481 | | | |
| III | මහජන පුස්තකාල අරමුදල් සංචිතය | 114,157,751 | 9,962,643 | 6,206,397 | 14,821 | | |
| IV | නාගරික සංවර්ධන සංචිතය | 13,931,674 | 4,871,039 | 1,972,390 | 2,171,021 | 1,847,873 | 1,222,761 |

3.2 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව විසින් මානව සම්පත් විධිමත්ව බඳවාගැනීම සහ යොදවාගැනීම සිදුකර නොතිබූ බැව් විගණනයේදී නිරීක්ෂණය විය. ඒ හේතුකොට ගෙන මානව සම්පත් 188 ක් විසින් සම්පූර්ණ කළ යුතු කාර්යයන් සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාද වී තිබුණි.

(ආ) වෘත්තීය සුදුසුකම් නොමැති, සේවා ව්‍යවස්ථාවට පටහැනිව 2013 වර්ෂයේදී පත්කරනු ලැබූ විදුලි කාර්මිකයන් තිදෙනෙකු සම්බන්ධයෙන් මේ දක්වාම අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) පසුගිය වසර පහකට අධික කාලයක් තුළ සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් 133 දෙනෙකුගෙන් ලැබිය යුතු එකතුව රු.652,486 ක්වූ හිඟ කාර්ය මණ්ඩල ණය අයකර ගැනීම සඳහා සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.3 මතභේදයට තුඩුදෙන ස්වභාවයේ ගණුදෙනු

---------------------------------------------

2011 ජනවාරි 31 දින එවකට සභාවේ සිටි නගරාධිපති විසින් පෞද්ගලික සමාගමක් සමඟ එළඹි කොන්ත්‍රාත්තුවට අනුව සභාවට අයිති ලාස් 7.295 ක ප්‍රමාණයෙන් යුත් වන්නාකුලම්හි පිහිටි ඉඩමක් සභා අනුමැතියෙන් තොරව භාරදෙනු ලැබ කොන්ත්‍රාත්කරු විසින් සභාවේ හා අනෙකුත් බලධාරීන්ගේ විධිමත් අනුමැතියක් ලබා නොගෙන සාප්පු ගොඩනැගිලි 28 ක් තනනු ලැබ, කඩ කාමර බදුකරුවන්ගෙන් රුපියල් මිලියන 102.96 මූලික තැන්පතු ලබාගෙන තිබුණි. කෙසේවුවද මෙම ගණුදෙනු පිළිබඳ සභාවෙන් අවසර ලබා නොගැනීම සහ කොන්ත්‍රාත්කරු විසින් සභාවට බැරකළ යුතු ආදායම් පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සභාව විසින් අර්ථවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

----------------------------

3.4.1 නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සිදුකිරීමට අසමත්වීම

----------------------------------------------------------

හානියට පත් තත්ත්වයෙන් යුක්ත සභාවට අයත් වාහන පහක් අංගනයේ පසුගිය වසර 05 සිට වසර 22 දක්වා වූ කාලයක් තුළ ඒවා අලුත්වැඩියා කිරීම සඳහා කටයුතු කිරීමෙන් තොරව පැවතිණි. එනමුත් ඊට හේතුන් විගණනයට ලබා නොදුනි.

3.4.2 වත්කම් භාරදීමට අසමත්වීම

-----------------------------

සභාව විසින් භාවිතා කරන වාහන තිස්හතරක අයිතිය සභාව නමින් පවරාගෙන නොතිබුණි.

3.4.3 අක්‍රිය වත්කම්

--------------

වාහන 31 ක් වාහන අංගනයේ අක්‍රියව පැවතුණි. එවැනි වාහන භාවිතයට ගත හැකි තත්ත්වයට වෙනස්කළ නොහැකි වුවත්, ඊට හේතුන් විගණනයට ලබා නොදුනි.

3.4.4 වාර්ෂික සමීක්ෂණ මණ්ඩල

-----------------------------

භාණ්ඩ 67 ක ඌනතාවය සහ බඩු වට්ටෝරු ලේඛනයේ ඇතුළත් නොකළ අයිතම 3156 ක් පිළිබඳ සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි කටයුතු කර නොතිබුණි. එසේවුවත්, ඊට හේතුන් විගණනයට ලබා නොදුණි.

3.5 අනාර්ථික ගණුදෙනු

---------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ පැවති හානියට පත් තත්ත්වයෙන් යුක්ත ට්‍රැක්ටර් 37 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු කිරීමෙන් තොරව, අපද්‍රව්‍ය රැස්කිරීම සඳහා කුලි පදනම මත ට්‍රැක්ටර් රථ පහළොවක් ලබාගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු.15,110,203 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකු විසින් පරීක්ෂා කිරීම සිදුකිරීම වෙනුවට, පෞද්ගලික සමාගමක් විසින් පික්අප් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා පරීක්ෂා කරනු ලැබ, 2015 වර්ෂයේදී පරීක්ෂා කිරීමේ ගාස්තු වශයෙන් රු.43,326 ක මුදලක් ගෙවා තිබුණි.

3.6 නීති විරෝධී ගෙවීම්

----------------------

නාගරික සංවර්ධන අධිකාරියේ 2008 අගෝස්තු 11 දිනැති අංක 21 දරන චක්‍රලේඛයට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සැලසුම් සඳහා අනුමැතිය දීම සඳහා වූ කමිටුවට නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, කොමසාරිස් සහ කටයුතුවලට සම්බන්ධිත අංශ ප්‍රධානීන් ඇතුළත්විය යුතු බැව් සඳහන්ව තිබුණි. එනමුත්, ඊට පටහැනිව සැලසුම් කමිටුවලට සහභාගීවීම වෙනුවෙන්, ප්‍රධාන ගණකාධිකාරී, කළමනාකාර සහකාරුවන්, සංවර්ධන නිලධාරීන්, කාර්මික නිලධාරීන් සහ සුළු සේවකයන්ට රු.497,500 ක මුදලක් ගෙවා තිබුණි. සැලසුම් සඳහා අනුමැතියදීමේ කමිටුවේ අංශ ප්‍රධානීන් ලෙස ඇතුළත් විය යුතු ලෙස පැහැදිළිව නිශ්චය නොකර, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, ඉංජිනේරු සහ තක්සේරු බදු අංශයේ ප්‍රධානී යන පාර්ශවයන්ට තවදුරටත් එකතුව රු.150,000 ක මුදලක් ගෙවා තිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

-------------------------------

අයවැය පාලනය

------------------

අයවැයගත ආදායම් යන තත්‍ය ආදායම් අතර රු.1,904,801 සිට රු.67,846,912 හෙවත් සියයට 9 සිට සියයට 60 දක්වා හා අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු.386,525 සිට රු.29,177,183 හෙවත් සියයට 11 සිට සියයට 44 දක්වා වූ පරාසයක විචලන නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්‍ෂණය වූ  අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

.

| පද්ධති | අඩුපාඩු |
| --- | --- |
| ------ | -------- |
| ගිණුම්කරණය | ඉඩම් විකුණුම් මත වූ බදු සඳහා ලේඛන සහ පරිඝනක නඩත්තු ලේඛනය පවත්වා ගැනීමට අසමත් වීම. |